සියලු හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

### 10 - ශ්‍රේණිය

### සිංහල භාෂාව හා සාහිත්‍යය - I

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 01යි.

<u>සැලකිය යුතුයි.</u>

(1) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

(2) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(3) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 04 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

(01) නූතන තරුණ පරපුර වැඩිහිටියන්ගේ ඉඟ නිතර බලා කටයුතු කළ යුතුය.

(1) මුහුණ බලා (2) වයස සලකා ගරුකර

(3) හිත ගත හිතට ගැන සලකා (4) වැඩිහිටියන් ගණන් නොගෙන

(02) ස්වාභාවික පරිසරයට අවිධිමත් ව කසළ බැහැර කිරීම යොත් මැල්ලක් බව රටවැසියෝ නොදනිති.

(1) පරිසරය මැල්ලක් (2) පරිසරයේ වටිනාකම නොදැනීම

(3) අනුත්ති පතනය ක්‍රියාවක් (4) අවබෝධයෙන් තොර

(03) සටින් බතල කොළ සිටුවන මිනිසුන් සමාජයේ දක්නට ඇත.

(1) සටින් බතල කොළ පිටවිය නොහැකි (2) කතාවේ දක්ෂයින්

(3) බතල කොළ අගින් පිටවිය යුතු (4) කතාවේ හැටියට වැඩ නැති

(04) ග්‍රාමෝදය සමිතියේ නිලධාරීන් අතර පවතින කඹ ඇදිල්ල නිසා පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අඩාළ විය.

(1) නිලධාරීන් පවතින කඹ ඇදීමේ තරඟය නිසා

(2) නිලධාරීන් අතර එකඟතාවයක් නැතිවීම

(3) නිලධාරීන් තමන්ගේ වාසියට කටයුතු කිරීම

(4) නිලධාරීන්ගේ බලලෝභීකම

- අංක 05 සිට 08 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ........................................ අධ්‍යාපන අමාත්‍යවරයෙකි.

(1) සර්වකාලීන (2) සාතවේදී

(3) සදානුස්මරණීය (4) සාතතාධිකාරී

(06) කාව්‍ය නිර්මාණයක විශිෂ්ටත්වයට හේතුවන ව්‍යුත්පත්තිය යනු ........................................ යි.

(1) නිතර නිතර අභ්‍යාසයේ යෙදීම

(2) පරිසර ආශ්‍රයෙන් නිර්මාණයේ යෙදීම

(3) අපූර්ව වූ ප්‍රතිසංස්කරණයක් ඉදිරිපත් කිරීම

(4) ජීවිත අත්දැකීමෙන් ලද පරිණත බුද්ධිය හා බහුශ්‍රැතභාවය

(07) දඹදෙණි යුගයේ විසූ දෙවන පරාක්‍රමබාහු රජතුමා ................................ ලේඛකයෙකි.

(1) අමරණීය (2) අද්විතීය (3) ප්‍රවීණ (4) ගෞරවනීය

(08) හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ මහතා ................................ නවකතාකරුවෙක් විය.

(1) නාමවේදී (2) අප්‍රකට (3) සුප්‍රකට (4) නාමගුණ

(09) අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

(1) රාජපක්ෂ වලව්ව , එකගෙයි අවුරුද්ද , පුංචිරාළ , කටු සහ මල්
(2) අඹ යහළුවෝ , තිලක සහ තිලකා , හැදෑයෝ , විලම්බිත
(3) ගම්පෙරළිය , කලියුගය , විරාගය , යුගාන්තය
(4) හිතට හිතක් , ගොළු හදවත , පිරුණු හදක් , ගැහැනු ළමයි

(10) අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

(1) මානුෂීය , ප්‍රතිග්‍රහණය , පෞරුශ , ද්‍රවණ
(2) ප්‍රචණ්ඩ , ප්‍රතාපය , ප්‍රමුඛ , නවාංගන
(3) ධර්මිෂ්ට , ශ්‍රමණික , අනුගම් , සංවර්ධන
(4) රාජන්‍යු , කාපෝවාද්ධ , ගෛලෙ , මිණි මෙවුල

(11) එක් එක් වචනවල දෙවන අකුරෙහි ඉස්පිල්ල රතාරාංශය. දීර්ඝ පාපිල්ල හා ගැටපිල්ල පිළිවෙළින් යෙදී ඇති වචන සහිත වරණය තෝරන්න.

(1) මාලිගාව , දුංගය , වේණුව , සාදු
(2) බහිරවයා , අප්‍රමාණ , රුසුණු , ද්‍රෝණ
(3) බහිතවා , අප්‍රසාදය , අදූරදර්ශී , විවාහ
(4) නාමික , අප්‍රමාද , නිර්මල , ගායන

(12) නිපාත බහුවචන පදයක් හා අනුක්ත නාමපද දෙකක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමයෙකු , මිනිසෙක් , සමහරෙක් , කාන්තාවක්
(2) ඇතැමෙක් , ගැහැනියක , අයෙක් , මෙයෙකු
(3) බල්ලෙකු , එක් අයෙක් , අපි , මවුනු
(4) මෙයෙකු , සමහරෙක් , මා , මැස්සෙක්

(13) කාලත්‍රයේ අසම්භාව්‍ය ක්‍රියාපදයක් සහිත වරණයක් තෝරන්න.

(1) යනිද්ද (2) නටවයි (3) වැස්සොත් (4) රකිති

(14) උපසර්ග පදයක් හා නිපාත පදයක් යෙදුණු වරණය තෝරන්න.

(1) පුවගාලු ගස් පුලගට වැටුණි.
(2) අක්කාත් මමත් පාඩම් කළෙමු.
(3) අනුනායක හිමියෝ පාඨ වැයිති.
(4) අපවිත්‍ර වූ පරිසරය යළි පිරිසිදුව තබා ගනිමු.

* අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ නිවැරදි ව්‍යාකරණ වර්ගය දැක්වෙන වරණය තෝරන්න.

(15) "අප්පා උඹේ හොර දෙටුවා
අම්මා හරිම කුණකට්ටුවා"

(1) උත්තම පුරුෂ හා මධ්‍යම පුරුෂ නාමපද වේ.
(2) මධ්‍යම පුරුෂ හා ප්‍රථම පුරුෂ නාමපද වේ.
(3) ප්‍රථම පුරුෂ හා උත්තම පුරුෂ නාමපද වේ.
(4) උත්තම පුරුෂ හා ප්‍රථම පුරුෂ නාමපද වේ.

(16) "පොහොය හැකි ද
පිල්ගත් බද්ද"

(1) උපසර්ග පදයකි.
(2) ක්‍රියා පදයකි.
(3) නිපාත පදයකි.
(4) තද්ධිත පදයකි.

(17) "ගොවිදන මහා වූ - දිනිය යුතු වූ පේ ම ලබිමි"

(1) සර්ව නාම පදයකි.
(2) ක්‍රියා විශේෂණයකි.
(3) නාම විශේෂණයකි.
(4) ක්‍රියා නාමයකි.

(18) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා - ලියවයි , බලවයි , නටමින් , කවවයි

(2) මධ්‍යම පුරුෂ නාම - තෝ , නුඹ , තෙපි , ප්‍රශ්මිතිය

(3) කෘදන්ත පද - නටන , බැලුම් , නැඟු , සිතා

(4) නිපාත පද - සෙක් , යූ , පටන් , සෙට

(19) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන වචනය සහිත වරණය තෝරන්න.

(1) උවදුර - අනතුර , උපද්‍රවය , පීඩනය , ආපදාව

(2) ගෙය - විමන , මැඳුර , නිවස , අගාර

(3) නාදය - නද , හඬ , රාවය , සත්

(4) රජ - නිරිඳු , මහිඳුම , මපල් , නරදෙව්

(20) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදයක් යෙදී ඇති වචනය සහිත වරණය තෝරන්න.

(1) උදක - අඹ , පැන් , නිරුදක , ජලය

(2) දාන්ත - සිතරු , ආමුණු , දුර්දාන්ත , හිංසර

(3) අවශේෂ - වෛකල්පිත , වෙනත් , විකල්ප , සෙසු

(4) අඥාන - නුවණ , මෝඩ , මුග්ධ , මෝහ

(21) යුගල පදයක් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) හිලහල , දුරවැසර , කළාකෙළා , ඇදුමකත්

(2) ඇදුසුදු , හිලහල , ගම්බිම් , කෙල්ලිපි

(3) ගුරුකරුකම් , වැරවැයම් , බෙරහෙත් , වාද භේද

(4) මංමාවත් , අමයි වමයි , හර බර , පුළු පටු

(22) උපමාවක් සහිත වරණය තෝරන්න.

(1) නුඹ සැට කෙලෙහි දිසි මෙන් තුරු පහන් වන

(2) සරහා දුරා සැර තහවනුව පමුදුරා

(3) සැදෑ පළුව පදමින් මග නිසාකත

(4) දිවිදාගේ රුවන් රජ සොඳ වසිඳුම

(23) තාලුජ අක්ෂර උපදින ස්ථාන පිළිබඳ ව නිවැරදි ව තියවෙන වරණය තෝරන්න.

(1) දිවේ තුඩ හා මූර්ධය ස්පර්ශ වීමෙන්

(2) දිවේ මැද හා තල්ලු ස්පර්ශ වීමෙන්

(3) දිවේ තුඩ හා දත් ස්පර්ශ වීමෙන්

(4) දිවේ තුඩ හා තල්ලු ස්පර්ශ වීමෙන්

(24) ඕෂ්ඨජ අක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.

(1) ශ , ෂ , ස , හ , ෆ

(2) ය , ර , ල , ව , ළ

(3) ප , ඵ , බ , භ , ම

(4) ච , ඡ , ජ , ඣ , ඤ

(25) මුලින් යෙදෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නොයෙදුණු වරණය සහිත පිළිතුර තෝරන්න.

(1) මහාප්‍රාණ අක්ෂර - ඛනිජ , සාධනය , ධාර්මික , ප්‍රතිඵල

(2) අල්පප්‍රාණාක්ෂර - වාරය , කාර්යාලය , සංගීත , ගහළුවා

(3) ඌෂ්මාක්ෂර - වර්ෂාව , පුලුව , සාහිත්‍යය , ප්‍රදර්ශනය

(4) දන්තජ අක්ෂර - සමනලයා , දානය , තවලම , ධනය

(26) ස්වරයක් මුල් ව යෙදෙන සන්ධි විධි ගණන දැක්වෙන වරණය තෝරන්න.

(1) පහකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි.

(27) නිවැරදිව විසන්ධි වී ඇති පද යුගලය සහිත වරණය තෝරන්න.

(1) වට + උර , දෙ + අවුරුදු

(2) සිතු + සම , මේ + අත

(3) මහිඳු + ගුහා , වලං + දෙක

(4) කටු + අත්ත , වීර + යෙක්

(28) පර රූප සන්ධිය සඳහා උදාහරණයක් දැක්වෙන වරණය තෝරන්න.

(1) මලපුත

(2) වැල්ලම්පිටිය

(3) කොත්තල

(4) පරද්දා

(29) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් ප්‍රකට වන ලේඛකයෙකුගේ නාමය නිවැරදි ව ඇතුළත් වරණය තෝරන්න.

(1) ම ග සෙ හ ර ම ක ර

(2) ලත් ජ ක සේ න කා රු ණ ය

(3) ලත ති ය සේ ජ ය

(4) වි ල රැ ව ඇ මි න් දු ත තු

- අංක 30 සිට 31 තෙක් ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(30) "කොහොඹ ගසේ සෙවණැල්ලෙනුත් සිසිල ලැබේ"

(1) කොහොඹ ගස් සෙවණට වඩා සරන බව

(2) අමිහිරි දෙයෙකින් මිහිරක් ඇති බව

(3) කොහොඹ ඉතා වටිනා ඖෂධයකි.

(4) සෑම ගසකට ම වටිනාකමක් ඇත.

(31) 'හරියා පඹගාලේ පැටලීම'

(1) කිසිදා සිදු නොවන දෙයකි.

(2) හරියාට පිළිවිය හැකි කරදරයකි.

(3) ප්‍රයෝගකාරී අයත් ඌගුලට අසුවීමකි.

(4) පඹගාලේ පැටලුණත් බේරීමට තරම් කපටි සතෙකි.

(32) මොනරාගල ජන වහරට අනුව "ගනමච්චා" යන වචනයේ අර්ථය සහිත වරණය තෝරන්න.

(1) මුදියන්සේ

(2) එළිපුළා

(3) ගෙයැව්වා

(4) වැපුරුවා

(33) පහත (අ) කොටසේ දැක්වෙන වචනවල අර්ථය (ආ) කොටස සමඟ අනුපිළිවෙළින් නිවැරදිව ගැළපෙන වරණය වන්නේ.

| | | | |
|---|---|---|---|
| A | චතුත්තිස | E | 84 |
| B | අටතුරාසිය | F | 18 |
| C | පුවාදු | G | 45 |
| D | පන්සාලිස් | H | 108 |

(1) G, E, F, H (2) G, G, E, H (3) E, F, G, H (4) F, H, E, G

(34) A සියවම් මිනිසා සම්පූර්ණ කරන ........................ නූතන පරම්පරාව පොතපත නොකියවති.

B මිනිසා දිගින් දිගට ම පරිසරය අපවිත්‍ර කිරීම ........................ ඩෙංගු රෝගය මර්දනය පසුතු ය.

C මුහුණු පොතින් අධ්‍යාපනික දැනුම ලද හැකි ........................ අවභාවිතය සහතාවුවට සාරණයි.

D ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය වැඩි කරලීම ........................ එහා සංග්‍රාමයට සක්‍රීය දායකත්වයක් සැපයිය යුතු ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(E - නිසා F - නමුත් G - සඳහා H - වුවත්)

(1) GFHE

(2) FEHG

(3) EGFH

(4) HEFG

(35) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ "වැඩිහිටි නිවාස අප සමාජයෙන් තුරන් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම්තුමා අපට කීවා"

(1) වැඩිහිටි නිවාස අපි සමාජයෙන් තුරන් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම්තුමා අපට ප්‍රකාශ කළේ ය.

(2) වැඩිහිටි නිවාස අප සමාජයෙන් තුරන් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම්තුමා අපට කියූහ.

(3) වැඩිහිටි නිවාස අප සමාජයෙන් තුරන් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම්තුමා අපට ප්‍රකාශ කළේ ය.

(4) වැඩිහිටි නිවාස අපි සමාජයෙන් තුරන් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම්තුමා අපිට ප්‍රකාශ කළෙමු.

- ප්‍රශ්න අංක 36, 37 , 38 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය සහිත වරණය තෝරන්න.

(36) (1) අප සමඟිය රැකිය යුත්තෙමු.

(2) බොදු දරුවෝ දහම් පාසලට පැමිණ ඇත.

(3) අපි ගිලනුන්ට උවටැන් කරනු වෙති.

(4) කම්කරුවෝ පස්දෙනෙක් කය වෙහෙසා වැඩ කළහ.

(37) (1) එහාමා තුමූ සන්සුන් ව ගමන් කළහ.
(2) දරුවන් දෙමව්පියන්ට කීකරු වීම මැනවි.
(3) රියදුරන් මාර්ග නීති අනුගමනය කළ යුත්තෝ ය.
(4) මම ගෙට ගොඩ වී යයි නොසිතන්න.

(38) (1) කර්මාන්ත ශාලා විසින් විෂ වායුව පිටකරනු ලබති.
(2) කර්මාන්ත ශාලාවෝ විසින් විෂ වායුන් පිට කරනු ලැබේ.
(3) කර්මාන්ත ශාලා විසින් විෂ වායු ද පිටකරනු ලබති.
(4) කර්මාන්ත ශාලාවෝ විසින් විෂ වායු පිටකරනු ලබති.

(39) ඇති මුත් මිණි මුතු අබරණ - දිලු මුත් සම්පත් අපමණ
වූවහොත් රජ සතුරු වෙනත් - රුදු වන වලසුන් වලගේ
ඉහත ගීය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය වන්නේ,

(1) සිංහබාහු නාටකය
(2) කුසුවරයේ කතාව
(3) මනමේ නාටකය
(4) වෙස්සන්තර නාටකය

(40) දී ඇති අදහසට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.
"සාහිත්‍යකරුවා සිය නිර්මාණයට පාදක කරගන්නා අත්දැකීමෙන් විශ්වසනීයතාවය තහවුරු කිරීමට ඔහුගේ භාෂා භාවිතය ඉවහල් වේ.
(1) සාහිත්‍යකරුවා සිය නිර්මාණයට පාදක කරගන්නා භාෂාවෙන් තහවුරු කිරීමට විශ්වසනීය බව ඉවහල් වේ.
(2) භාෂා භාවිතයෙන් සිය නිර්මාණයේ විශ්වසනීය බවත් අත්දැකීමත් තහවුරු වේ.
(3) සාහිත්‍යකරුවා සිය නිර්මාණයට පාදක කරගන්නා අත්දැකීමෙහි විශ්වසනීය බව තහවුරු කිරීමට ඔහු සතු භාෂා භාවිතය ඉවහල් වේ.
(4) සාහිත්‍යකරුවා සිය නිර්මාණයට පාදක කරගන්නා අද භාෂාව භාවිතයෙන් අත්දැකීමෙහිත් විශ්වසනීයතාවය තහවුරු වේ.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

### 10 - ශ්‍රේණිය

### සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම/විභාග අංකය :- .................................................................... කාලය: පැය 02යි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනු කොටසට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) පරන (ආ) පරණ

(ii) පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

මිනිස් සන්තානය තුළ පවතින දුක, තණහාවුව, සතුට, කලකිරීම, කාන්සිය වැනි හැඟීම් හා බැඳුණු රසභාවය එම ගායනය ප්‍රකාශනය කිරීම සඳහා නිතැතින් ම නිර්මාණය වූවකි.

(iii) තිල්මිණි දෙනුවන් අගා බැලූ ඇය සුරඟනක සේ දිස්විය.

(අ) මෙහි සඳහන් උපමාව ලියන්න.

(ආ) මෙහි දැක්වෙන රූපකයක් ලියන්න.

(iv) පහත සඳහන් තද්ධිත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන්කර ලියන්න.

(අ) විශේෂත්ව (ආ) දක්ෂතා

(v) පහත සඳහන් විසන්ධි පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(1) දෙ + ඇසිලි (ආ) කෙබි + අ

(vi) පහත සඳහන් පදවලට සමානාර්ථ පදයක් බැගින් ලියන්න.

(අ) ප්‍රගර්භය (ආ) අකුස්සෙන්

(vii) නිල ගොයම් කිරි වැදිලා
රන් අස්වනු නෙළනදාට
නගෝ අරට ඇඹුල අරන්
වෙලට වරෙන්නේ

(අ) මෙහි ඇති පූර්ව ක්‍රියා පදයක් උපුටා දක්වන්න.

(ආ) "වරෙන්නේ" යනු කුමන ක්‍රියා පදයක් ද?

(viii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියා දක්වන්න.

(අ) පුරා වස්තු තැන්පත් කර ඇති ස්ථානය

(ආ) කාව්‍යය සඳහා යොදා ගන්නා නියමන්

(ix) පහත දී ඇති වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) දක්ෂ නළුවන් විසින් රසිකයෝ සතුටු කරනු ලබයි.

(ආ) පැරැන්නෝ කල්යල් බලා වගා කළහ'යි වැඩිහිටියෝ පවසති.

(x) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා යෙදෙන පොදු ව්‍යවහාර ලියන්න.

(අ) සුදනවා (ආ) වත්තම්මා

(ලකුණු 2 × 10 = 20)

(02) පහත සඳහන් (අ) , (ආ) , (ඇ) , (ඈ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය වර්තමානය වන විට බහුල ව දක්නට ලැබෙන්නකි. මෙය මැඩ පැවැත්වීම සඳහා රජය විවිධ අයුරින් පියවර ගනු ලැබුව ද දිනෙන් දින අසන්නට ලැබෙන සිදුවීම්වලින් එය අඩුවක් වන බවක් පෙනෙන්නට නැත. රිය අනතුරුවලට ප්‍රධාන සාධකයක් වී ඇත්තේ මත්ද්‍රව්‍ය භාවිත කොට රිය පැදවීමයි. පවුල් සංස්ථාව බිඳ වැටීම, ඝාතනයන් බහුල වීම, රෝ දුක්වලින් පෙළීම තවත් ඛේදනීය ප්‍රතිඵලයන් ය. නීති රීති මගින් පමණක් එය නවතාලිය නොහැකියි පිළිගත යුතු කාලය පැමිණ ඇත.

(ආ) සොබාදහම හා බැඳුණු වී ගොවිතැන, හේන් ගොවිතැන, කුඹල් කර්මාන්තය වැනි අපේ පැරණි වෘත්තීන් අද අභාවයට යමින් පවතී. නූතන තාක්‍ෂණය හා විද්‍යාත්මක ප්‍රවණතා යොදා ගැනීම මගින් එම වෘත්තීන් නගා සිටුවීමට හැකිවෙයි. පරිසරය හා බැඳුණු පරිසර දූෂණයෙන් තොර එම සාම්ප්‍රදායික වෘත්තීන් දියුණු කිරීමෙන් ශ්‍රී ලංකාවේ අනන්‍යතාව ලොවට ගෙන යා හැකි ය.

(ඇ) වර්තමානයේ අලි මිනිස් ගැටුම් නිසා සිදුවන විපත් බොහෝ ය. වනාන්තර විනාශය හා වනාන්තර ප්‍රදේශ හරහා මාර්ග ඉදිවීම නිසා අලි ගම් වැදීම සිදුවේ. ගම්මානවල සිටින අහිංසක ජනතාවගේ වගා බිම් මෙන් ම ගේ දොර දේපළ ද විනාශ වී යයි. මේ සඳහා සුදුසු පියවර කඩිනමින් ගැනීම අත්‍යවශ්‍යය.

(ඈ) ලෝකය නවීන තාක්‍ෂණය මත රඳා පවතී. තාක්‍ෂණයත් සමඟ තරුණ පරපුර පරිගණකය ඔස්සේ සමාජ වෙබ් අඩවි, මුහුණු පොත, අන්තර්ජාලය හා බැඳී සිටිති. මේ නිසා යහපත මෙන් ම අයහපත ද සිදුවීම කනගාටුවට කරුණකි. අධ්‍යාපනය හා නව ලොව ජය ගැනීමට පමණක් තාක්‍ෂණය යොදා ගැනීම සඳහා වැඩිහිටි ආදර්ශය සමඟ මඟ පෙන්වීම ද අවශ්‍ය ය.

(ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව අග ලියන්න.

කාව්‍යයක වස්තු විෂය හෙවත් කාව්‍යයෙන් කියවෙන අන්දැකීම එහි ආකෘතියට වඩා බොහෙවින් වැදගත් ය. කාව්‍යයේ භාෂාව මෙන් ම එහි ආකෘතිය ද යම්කිසි අන්දැකීමක් කීමට එකල් කරගන්නා උපකරණයක් පමණි. එක් අන්දැකීමක් ප්‍රබල ලෙස කියා පෑමට පැරණි කාව්‍ය ආකෘතිය උචිත වන්නා සේ ම වෙනත් අන්දැකීමක් කීමට නිදහස් ආකෘතියක් වඩා උචිත වීමට පුළුවනි. එබැවින් නිදහස් ආකෘති පසෙක ලා පැරණි රීති හුවා දැක්වීම හෝ පැරණි රීති පසෙක ලා නිදහස් ආකෘති හුවා දැක්වීම හෝ පලක් නැත. කවියෙකුට මේ හැම ආකෘතියක් ම අවස්ථානුරූප ව අවශ්‍ය වෙයි.

සම්ප්‍රදාය ගැන වාද කරන බොහෝ දෙනා එල්බෙනුයේ කාව්‍යයේ නොවැදගත් අංගයක් වන ආකෘතියෙහිය. වඩා වැදගත් අංගයක් වන වස්තු විෂය හෙවත් කාව්‍යයෙන් කියැවෙන අන්දැකීම සම්ප්‍රදායට එකඟදැයි සොයා බැලීමට ඔවුහු අමතක කරති. සම්ප්‍රදායානුකූලවීම යනු පැරණියන් ගිය මඟ අකුරට ම අනුගමනය කිරීම නොවේ. එසේ ම එය නිර්මාණකරුවාගේ පෞද්ගලිකත්වය අනුව ඉබේ සිදුවන්නක් මිස සිතා මතා අනුගමනය කිරීම නොවේ. සම්ප්‍රදාය යනු නිර්මාණකරුවාගේ ඇඟට කා වැදී තිබී නිර්මාණය තුළ නිරායාසයෙන් ගලා ආ යුතු ගුණයකි. එය නිර්මාණය තුළට පිටින් කා වැද්දිය හැක්කක් නොවේ. සම්ප්‍රදායානුකූල වීම යනු පැරණියන් අනුකරණය කිරීම ම නම් අලුත් මං සොයා යාමට ඉඩක් නැත. (ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෘතුගීසි උවදුරෙන් බේරෙන්ට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඕලන්දයන්ගේ පාලන බලයට යටත් විය. අවුරුදු එකසිය පනහක් පමණ පහතරට ආණ්ඩුකළ ඕලන්දකාරයෝ ද ශිල්ප ශාස්ත්‍ර දියුණු කිරීමෙහි නිරත නොවූහ. වෙළෙඳාමෙන් ධන සංචය කිරීම ඔවුන්ගේ එකම අභිප්‍රාය විය. මේ සමයෙහි ස්වාධීන සිංහල රාජ්‍යයක් උඩරට පළාත්වල පැවති නමුත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ රජවරු එහි රජකම් කළහ. කැබිනිද් යන පැරණි රදළ ක්‍රමයකින් යුක්ත වූ උඩරට සිංහල සමාජය අතර මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ උසස් අංග විද්‍යාමාන නොවීය. සිංහල හෝ දමිළ හෝ යම්තම් ලියන්නට කියවන්නට ඉගෙන ගැනීමක් හැර අන් කිසි අධ්‍යාපනයක් එකල උඩරට හෝ පහතරට නොතිබුණේ ය. අවුරුදු තුන්සියයකට පෙර පටන් පිරිහෙමින් පැවති චිත්‍ර ශිල්පයත් සංගීතයත් මේ කාලයේ දී සිංහලයන් අතුරින් සම්පූර්ණයෙන් ම බැහැර ගොස් තිබුණු බව පෙනෙන්නට ඇත්තේ ය. ආගමික කාව්‍යයන්ට ද

ශාසනෝන්නතියට ද අවශ්‍ය වූ නිසා නැටුම් ශිල්පය රජ්ජුරුවන් කොට ගත් අනෙකුත් සුලුවල මිනිස්සු නාට්‍ය ශිල්පය ආරක්ෂා කළහ. ලංකාවේ පැරණි කලාවන් අතුරින් නාට්‍ය ශිල්පය පමණක් සිංහලයන් අතර ශේෂව පැවතුණේ මේ නිසා ය.

(1) ලංකාවේ ලන්දේසි පාලන කාලය කොපමණ ද?
(2) මෙම කාලයේ දී සිදු කෙරුණු කාර්යය කුමක් ද?
(3) ලන්දේසි ජාතිකයින්ගේ බලාපොරොත්තුව කුමක් ද?
(4) නාට්‍ය ශිල්පය පමණක් ඉතිරිවීමට හේතුව ලියා දක්වන්න.
(5) නායකයන්, ශේෂව යන වචනවල අර්ථය වෙන වෙන ම ලියන්න. (ලකුණු 10)

(06) නගරයට ආසන්න සුන්දර ගමක් වන සිරිමල් වත්ත ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ධර්මසේන කනිටු විද්‍යාලේ කෘෂි විද්‍යා සංගමය මගින් ගෙවතු වගා තරඟයක් සූදානම් කර ඇත. එයාවන් සඳහා උපදෙස් හා බීජ වර්ග ලබා ගැනීමට ප්‍රදේශයේ කෘෂි මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂතුමාට යවන ලිපිය ලියන්න. ඔබ පාසලේ කෘෂි විද්‍යා සංගමයේ ලේකම් රජත් පරණවිතාන බව සිතන්න. (මේ සඳහා වචන 100ක් පමණ සෑහේ.)

නැතහොත්

ක්‍රීඩාවේ විනයගරුක බව අනිවාර්ය අංගයකි. එහෙත් ක්‍රීඩාවේ අරමුණු සඳහා නොයෙක් අයුතු විශ ජයග්‍රහණ පමණක් යයි සිතති. මහා පෞරුෂ වර්ධනයක් ක්‍රීඩාවෙන් ගොඩ නැගෙන බව අමතක කරති. "ක්‍රීඩාවට පෙර විනය ගොඩ නගමු" යන මැයෙන් පුවත්පත් වාර්තාවක් ලියන්න. (මේ සඳහා වචන 100ක් පමණ සෑහේ.) (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02යි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) නිදහස මග මුහුදක් වේ
එහි උල්පත ප්‍රඥා නුවණ වේ
ඒ බව සිහිකොට මෙ ලොවේ
ගුණුකම් ඉටු කළ යුතු වේ

(අ) ඉහත පද්‍යය අඩංගු දීර්ඝ පද්‍ය පන්තිය කුමක් දැයි නම් කරන්න.

(ආ) 'නිදහස මග මුහුදක්' යන්නෙහි ඇතුළත් අලංකාරය කුමක් ද?

(ii) "මේ සා වූ තොපගේ උපායකින් වැඩකුත් හිමාවතුත් දුටු දෑ නැති."

(අ) මේ ප්‍රකාශය කළේ කවු ද?

(ආ) ඉහත උද්ධෘතය උපුටා ගත් ග්‍රන්ථයට මූලාශ්‍රය වූ කෘතිය නම් කරන්න.

(iii) ඇස නැති දා පොත ගන්නේ තියන්ට ද
දත නැති දා උක් දඬු තමන්ට ද
වෙර නැති දා ගහ ගන්නේ දීනන්ට ද
සුද නැති දා නැති සඟ තොත් තොටන්ට ද

(අ) ඉහත පද්‍යය උපුටා ගත් පාඩම නම් කරන්න.

(ආ) 'සඟ' යන්නෙහි අර්ථය ලියන්න.

(iv) (අ) ගුත්තිල කාව්‍යය ලියැවුණේ කුමන රජ කෙනෙකුගේ පාලන සමයේ ද?

(ආ) ඒ සඳහා ආරාධනා කළ අගමැතිවරයා කවරෙක් ද?

(v) "එහෙයින් මිනු මළුත් ජීවිතාන්තය දක්වා පිරංගෙදර සිටියත් ඈට එහි අමුත්තක් නැත."

(අ) මෙහි 'මිනු' යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(ආ) ඉහත උද්ධෘතය උපුටා ගත් ග්‍රන්ථයේ මුල් කෘතියේ රචකයා නම් කරන්න.

(vi) "ඇයි ද වල්කළා පොරවා
ලෙලන තුද ඉන්නේ"

(අ) ඉහත උද්ධෘතය ඇතුළත් නිර්මාණය කාගේ ද?

(ආ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(vii) "සියොත් තුදෙක් පවට ම ලප්පා වන්නී ය. ඔබ ගමන නොකැමැත්තෙමි."

(අ) ඉහත ප්‍රකාශය අපා සිටියේ කවුරුන් ද?

(ආ) මෙහි 'සියොත්' යනුවෙන් හඳුන්වන්නේ කොහි ද?

(viii) (අ) ගංගාවේ සංගීතය පැදිපෙළ කාගේ නිර්මාණයක් ද?

(ආ) කවියාගේ වෙනත් පද්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

(ix) දියුණු දියුලුව　　　සඳ
නික්ම පැතිරෙන දසත　　විහිදෙ
(අ) මෙහි මුල් පද්‍ය පාද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(x) (අ) බැද්දේගම නවකතාව සිංහලයට අනුවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) විහගය පරිසරය පසුබිම් කරගෙන ලියැවුණු ඔහු විසින් පරිවර්තනය කරන ලද කෘති දෙකක් නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) මේ රුදු දෝසා කල මේ දේ
මා පුතු නොහැකා වීපායේ
**මුව පත් වූයේ**
**කියන එකෙන්**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.
(ආ) ඉහත උද්ධෘතය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) "ඉතා ම **මිහි** සා සැටිය. නැමැත්තෙහි වී නම් **හිලින්** පොදියක් බැඳගෙන ගොස් බව පුරා හා නොම යැ."
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.
(ආ) පාඨයේ අදහස සරල බසින් ලියන්න.

(iii) සත්තල වෙණ සද ඇසුමෙහි　　ලොවිනේ
රත් රසු දැල් කොලුගල වන　　බිංගෙනේ
පත් පල නොව විහි මිදි රූ　　ලෙසිනේ
තත් හග සෙන් සිරියෝ සිරි　　මතිනේ

(අ) **සතට මිහිරි වූ** සහ **අඹර ශෝභාව** යන අරුත් දෙන පද පද්‍යයෙන් උපුටා ලියන්න.
(ආ) පද්‍යයේ සඳහන් උපමාව තෝරා ලියන්න.

(iv) නොකඩ බලාපොරොත්තුව නිසා ඇ තුළ තිබුණ බිය ක්‍රමයෙන් තුනී ව යන්නට වන.

(අ) මෙහි "ඈ" යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද?
(ආ) මෙහි සඳහන් නොකඩ බලාපොරොත්තුව කුමක් ද?

(v) සඳු බැවුමින දං බෝවරි පදුරු　　තලා
පහළට ඇදී පර මල් පෙති ඉවත　　හොළා
**සැලපේ දියෙන් පොගවා රන් පුළින**　　තලා
සංගීතවත් වී යම් ඉදිරියට　　ගලා

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.
(ආ) ගංගාව ඉදිරිපිට ගලා යන ස්වරූපය දැක්වෙන කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 4 × 5 = 20)

(03) (අ) කේවට්ටයන් යොදන විවිධ උපායයන් ද.

(ආ) මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥා මහිමය හමුවේ ඒවා අසාර්ථක වන අයුරු ද.

සතර කන් මන්ත්‍රණයෙන් කියැවේ. උම්මග්ග ජාතකයේ නියමිත කොටස ඇසුරෙන් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

වෙණ මිහිර පද්‍ය පන්තිය තුළින් ගුත්තිල කවියාගේ අපූර්ව කවිත්වය ඉස්මතු වන්නේ.

(1) කවියා යොදා ගත් කාව්‍යාලංකාරත්

(2) වෙණ මිහිර ඇසුවන් ඇසුරින් කළ වර්ණනාත් නිසා ය.

එකිනෙකට සුදුසු උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(04) (1) ගැමියන් මුහුණ දෙන දුක් පීඩා නිසා පැමිරත්.

(2) පරිසරයේ පැවැති ස්වරූපය නිසා පැමිරත්.

බැද්දේගම කතුවරයා යොදා ගත් බස්වහර භුවනල් වී ඇති ආකාරය එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

"සිංහබාහු" විශිෂ්ට නාට්‍යයක් බවට පත්වීමට

(1) නාට්‍යයේ ඇතුළත් නාටෝචිත අවස්ථා

(2) නාට්‍යයේ ගැටුම

බලපා ඇත. නිර්දේශිත කොටස ඇසුරෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

(05) සොබාදහමේ සිදුවන අපූර්ව සිදුවීමක් සජීවී අයුරින් ගෙන හැර පෑමට කුඩලිගමයන් තුළ වූ කුසලතාව ගංගාවේ සංගීතය පැදි පෙළෙන් නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(06) ජාතිකාභිමානී ගැමි දරුවන්ගේ සිත් සතන් තුළ ජනිත කරවීමට කවියා යොදා ගත් බස් වහර කෙබඳු දැයි මුනි සිරිපා සිඹිමින්නේ පැදි පෙළ ඇසුරෙන් නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 10)

(07) සමාජයට යහ මග පෙන්වන අත්දැකීම් බහුල නැණැත්තකු වූ ජනකවියා තුළ වූ හැකියාව 'නානා තිය පානා අඬහැරෙන් දැමේ' පැදි පෙළ ඇසුරින් නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)